# ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2018

**7 ශ්‍රේණිය** **පුරවැසි අධ්‍යාපනය**

**නම :** ..........................................................................................................................

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.**
- **ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතුරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1) වර්තමාන සමාජයේ න්‍යෂ්ඨික පවුල් වැඩිවීමට හේතුවක් වන්නේ,
   1. එකමුතුබව අඩුවීම ය. 2. පවුලේ සමගිය ය.
   3. නිවාසවල ඉඩකඩ ප්‍රමාණවත් නොවීමය. 4. වසංගත රෝග පැතිරයාම ය.

2) පුද්ගලයෙකු තුළ ඇතිවිය හැකි යහපත් චිත්තවේග තත්වයක් වන්නේ මින් කුමක්ද?
   1. බිය 2. කෝපය 3. දුක 4. කරුණාව

3) ඔබගේ අනන්‍යතාව පෙන්නුම් කරන ලක්ෂණයකි.
   1. නීරෝගි බව 2. සුවිශේෂ හැකියාවන් ඇති බව.
   3. අභියෝගයන්ට මුහුණදීමේ හැකියාව 4. අධ්‍යාපනය

4) දත්ත හා තොරතුරු වලට අයත් වන්නේ,
   1. ජිවීත අත්දැකීම් පමණි. 2. ලිඛිත දේ පමණි.
   3. ලිඛිත හා ජිවීත අත්දැකීම් වේ. 4. ඉහත කිසිවක් නොවේ.

5) පාසල් ශිෂ්‍යයෙකු ලෙස තම ජිවීත අරමුණු සාර්ථක කරගැනීම සඳහා ඔබ කළ යුතු වන්නේ.
   1. කාලසටහනකට අනුව වැඩ කටයුතු නොකිරීමය.
   2. ගුරුවරුන්ගේ සිත් රිදවීමය.
   3. හොඳින් අධ්‍යාපන කටයුතු වල නිරත වීමය.
   4. තමා කැමති විෂයයන් පමණක් හොඳින් පාඩම් කිරීමය.

- අංක 06 සිට 10 දක්වා වඩාත්ම ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

6) තම ජිවන අරමුණු ඉටුකර ගැනිම සඳහා ක්‍රියාත්මක වීමේදී මුහුණ දීමට සිදුවන බාධක හා සීමාවන් වන්නේ.
   (අභියෝගයන්ය / ජයග්‍රහණයන්ය)
7) විවිධ වු මිනිස් අවශ්‍යතා මුලික කරගෙන සමාජ සංවිධාන බිහිවේ. ඒවායේ සමස්ත එකතුව වනුයේ,
   (ජනගහනයයි / ජන සමාජයයි)
8) දෙමාපියන් හැඳින්විය හැකි අන්වර්ථ නාමයක් වන්නේ,
   (පූර්වාචාර්යරුන්ය / ගුරු දෙවියන්ය)
9) බහු සංස්කෘතික ජන සමාජයක දක්නට ලැබෙන්නේ,
   (විවිධ ජන වර්ගය / විවිධ අධ්‍යාපන ආයතනය)
10) සමාජයක යහැවැත්ම උදෙසා එහි ජීවත් වන පුද්ගලයන් විසින් ආරක්ෂා කරනු ලබන්නේ,

(සාරධර්මය / නිධන් වස්තුය)

- අංක 11 සිට 15 දක්වා දී ඇති වාක්‍ය හරි නම් (√) ලකුණද වැරදි නම් (x) ලකුණද වරහන තුළ යොදන්න.

11) ඕනෑම ගැටලුවකට හෝ ප්‍රශ්නයකට ඇත්තේ එක විසඳුමක් පමණි. ( )

12) පියාගේ බාල සහෝදරයා මෙන්ම මවගේ බාල සහෝදරියගේ ස්වාමිපුරුෂයා බාප්පා ලෙස අමතනු ලැබේ. ( )

13) මිනිසා පසුකළ විවිධ යුග දෙස බැලීමේදී මිනිස් ජන සමාජය සරල මට්ටමින් ආරම්භ වී ඉතා සංකීර්ණ ස්වභාවයකට පත්ව ඇත. ( )

14) සම්ප්‍රදායන් හා ආදර්ශයන් බාල පරපුරට උරුම කරලීමට ඥාතීන්ගේ ඇසුර බෙහෙවින් බලපායි. ( )

15) පවුලේ සාමාජිකයන්ගේ රැකවරණය සඳහා බාහිර පුද්ගලයන්ගේ සහාය ලබාගැනීම යහපත් ක්‍රියාවකි. ( )

- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉරි මත ලියන්න.
  (කම්කරු කොමසාරිස්, අභියෝග, චිත්තවේග, වෙළඳපොළ, අවශ්‍යතා, සාරධර්ම)

16) තමාගේ සිත තුළ යහපත් .................................................. ඇති කර ගැනීම පුද්ගලයාට මෙන්ම සමාජයටද හිතකර වේ.

17) එක් එක් පුද්ගලයන් මුහුණදෙන විවිධ අවස්ථාවන් වලදී සිත තුළ ජනිත වන සිතුවිලි හා හැඟීම් .............................................. ලෙස හැඳින්වේ.

18) වයස අවුරුදු 14 ට අඩු දරුවන් සේවයෙහි යොදවා ඇති විට දනුම් දිය යුත්තේ ..................................................... ය.

19) බුද්ධිමත් පාරිභෝගිකයන් වෙනස් වන ............................................ තත්ව හමුවේ විචාරශීලීව කටයුතු කළ යුතුයි.

20) පුද්ගලයෙකුට හා පවුලකට බොහෝ .......................................................... තනිව ඉටුකර ගැනීම අපහසුය.

(ල. 2 x 20 - 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.**

1) i) පවුලේ සාමාජිකයෙක් ලෙස ජීවත්වීම නිසා අත්වන ප්‍රයෝජන 2 ක් ලියන්න. (ල. 02)

   ii) පවුලේ සාමාජිකයෙකු ලෙස වර්ධනය කරගත යුතු යහපත් ගුණාංග 2 ක් ලියන්න. (ල. 02)

   iii) චිත්තවේගී අවස්ථා 2 කට උදාහරණ ලියන්න. (ල. 02)

   iv) දෛනිකව ඉදිරිපත් කෙරෙන අපට අත්‍යවශ්‍ය වන තොරතුරු 2 ක් ලියන්න. (ල. 02)

   v) අභියෝග වලට මුහුණදීම සඳහා ඔබ තුළ වර්ධනය කරගත යුතු ගුණාංග 2 ක් ලියන්න. (ල. 02)

   vi) විවේක කාලයේදී යෙදිය හැකි සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් 2 ක් ලියන්න. (ල. 02)

   vii) ඇසුරුම් සහිත නිෂ්පාදන වල මුද්‍රණය කර ඇති විශේෂිත දේවල් 2 ක් ලියන්න. (ල. 02)

   viii) ළමා ශ්‍රමිකයන් සේවයේ යෙදවීමෙන් ඇතිවිය හැකි බලපෑම් 2 ක් ලියන්න. (ල. 02)

2) i) පවුල තුළ දක්නට ලැබෙන පොදු ලක්ෂණ 2 ක් ලියන්න. (ල. 02)

ii) පවුල තුළ පවත්වාගෙන යනු ලබන සම්ප්‍රදායන් 4 ක් ලියන්න. (ල. 04)

iii) න්‍යෂ්ඨික පවුලකට සාපේක්ෂව විස්තෘත පවුලක විශේෂ ලක්ෂණ 3 ක් ලියන්න. ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.

(ල. 05)

3) i) දෙමාපියන් හා දරුවන් අතර අන්තර් සම්බන්ධතාවය තුළ දෙමාපියන්ගෙන් දරුවන්ට ඉටුවිය යුතු යුතුකම් 2 ක් ලියන්න. (ල. 02)

ii) පවුලක සාමාජිකයෙකු ලෙස ජීවත්වීමේදී ලැබෙන අයිතිවාසිකම් 4 ක් ලියන්න. (ල. 04)

iii) ක්‍රීඩාවල යෙදීමෙන් පුද්ගලයෙකු තුළ වර්ධනය වන ගුණාංග 3 ක් ලියන්න. ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

4) i) වර්තමානයේ පවුල් ඒකක මුහුණපාන අභියෝග 2 ක් නම් කරන්න. (ල. 02)

ii) අයහපත් චිත්තවේගී තත්ව පාලනය කරගැනීම සඳහා අනුගමනය කළහැකි කාර්යයන් 4 ක් ලියන්න. (ල. 04)

iii) පුද්ගලයෙකු තුළ වර්ධනය කරගත යුතු සාරධර්ම 3 ක් ලියන්න. ඉන් එකක් පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. (ල. 05)

5) i) වයස අවුරුදු 14 ට අඩු දරුවන් සේවයෙහි යෙදවීමෙන් ඇතිවිය හැකි අයහපත් ප්‍රතිඵල 2 ක් ලියන්න. (ල. 02)

ii) ළමා ශ්‍රමිකයන් සේවයෙහි යෙදවීම තුළින් ළමයින්ට ඇතිවන අහිතකර බලපෑම් 4 ක් සඳහන් කරන්න. (ල. 04)

iii) ළමා ශ්‍රමිකයන් හා සම්බන්ධ සමාජ වගකීම් 3 ක් ලියා ඉන් එක් වගකීමක් පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.

(ල. 05)

6) i) අයහපත් චිත්තවේග 2 ක් ලියන්න. (ල. 02)

ii) වර්තමාන සමාජයේ සාමාජිකයන් මුහුණපාන අභියෝගාත්මක අවස්ථා 4 ක් ලියන්න. (ල. 04)

iii) බුද්ධිමත් පාරිභෝගිකයෙකු ලෙස කටයුතු කිරීමේදී සලකා බැලිය යුතු කරුණු 2 ක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

7) i) 'ලොව කිසිම පුද්ගලයෙක් තවත් පුද්ගලයෙකුට සමාන නොවේ.' වර්තමානයේ පුද්ගලයෙකු සුවිශේෂී ලෙස හඳුනාගැනීම සඳහා උපයෝගී කර ගන්නේ කුමන පරීක්ෂණයක්ද? (ල. 02)

ii) පවුලේ සාමාජිකයෙකු වර්ධනය කරගත යුතු යහපත් ගුණාංග 4 ක් ලියන්න. (ල. 04)

iii) ඔබේ අනන්‍යතාව පෙන්නුම් කළ හැකි සලකුණු 2 ක් ලියා ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)